| | |
|---|---|
| **චක්‍රලේඛ අංක :- 09/2007** | මගේ අංකය:- බප/සසේකො/ලේ.නිර්/2007<br>සමුපකාර සේවක කොමිෂන් සභාව(බ.ප.),<br>අංක 50, කිතුල්වත්ත පාර,<br>කොළඹ - 08.<br>2007.05.08 |

**බස්නාහිර පළාතේ සියළුම විවිධ සේවා සමුපකාර සමිති,**
**සභාපතිවරුන් වෙත.**

**208:15 වැටුප් පරිමාණ වෙළඳසැල් කළමණාකරු හා 308:16 වැටුප් පරිමාණ වෙළඳ සහායක තනතුරුවලට බඳවා ගැනීමේ සුදුසුකම් සංශෝධනය කිරීම**

---

ඉහත සඳහන් කරුණට අදාළව මෙම කොමිෂන් සභාව විසින් නිකුත් කල අංක 13/2005 දරණ චක්‍රලේඛය යටතේ, **15 වන වැටුප් පරිමාණයේ** වෙළඳසැල් කළමණාකරුවන් බඳවා ගැනීමේ (ආ) සුදුසුකම් යටතේ **දක්වා ඇති වසර 01** ක පළපුරුද්ද පිළිබඳ අවශ්‍යතාවය හේතු කොට ගෙන නවක සේවකයින් මෙම තනතුරට බඳවා ගැනීමේ අපහසුතා පැන නැඟී ඇති බව මෙම කොමිෂන් සභාවට වාර්තා වී ඇත. **එබැවින් එකී සුදුසුකම්** පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

| | |
|---|---|
| තනතුරේ නම:- | වෙළඳසැල් කළමණාකරු |
| වැටුප් පරිමාණය :- | 208:15 |
| වැටුප් ක්‍රමය:- | 43200-960X10-1020X8-60960 |
| අවම වයස:- | අවුරුද්ද 21 |
| උපරිම වයස:- | අවුරුද්ද 45 |
| තනතුර සඳහා සුදුසුකම්:- | (අ) සමුපකාර සේවක 16 වන වැටුප් පරිමාණයේ අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවුරුද්ද 2 කට නොඅඩු පළපුරුද්ද හෝ<br><br>(ආ) සමුපකාර සේවක(සාමාන්‍ය පෙළ) සහතිකය/ අ.පො.ස.(සාමාන්‍ය පෙළ) අංක ගණිතය/වානිජ අංක ගණිතය/ගණිතය හා සිංහල/දෙමළ භාෂාව ඇතුළුව විෂයයන් 6 කින් දෙවරකට නොවැඩි වාර ගණනක දී සාමාර්ථය(සමුපකාර සේවක සාමාන්‍ය පෙළ හිමි අයදුම්කරුවන් විශේෂයෙන් සලකා බලනු ලැබේ.) |

02. සම්මුඛ පරීක්ෂණ මගින් නිර්දේශිතව කොමිෂන් සභාවේ අනුමැතිය අනුව (ආ) සුදුසුකම් යටතේ තෝරා ගනු ලබන වෙළඳසැල් කළමණාකරුවනට මාස 03 ක පුහුණුවක් සමිති විසින් ලබා දිය යුතුය. පුහුණු කාලය තුළ සේවය, පැමිණීම සහ හැසිරීම් අයහපත් වන සේවකයින්ගේ තනතුරු අහෝසි කිරීමට නිර්දේශ කරනු ලබන්නේ නම්, ප්‍රමාණවත් හේතු සහිතව ඒ සඳහා කොමිෂන්

සභාවේ අනුමැතිය ලබා ගත යුතුය. පුහුණු කාලසීමාව හෝ පරිවාස කාලසීමාව තුළ සේවය පැමිණීම සහ හැසිරීම අයහපත් වන්නේ නම් කිසිදු හේතුවක් නොදන්වා පත්වීම අහෝසි කළ බව පත්වීම් ලිපියේ පැහැදිලිව සඳහන් විය යුතුය.

සුදුසුකම් පිළිබඳ

03. 208:15 වැටුප් පරිමාණ වෙළඳසැල් කළමණාකරු තනතුර සම්බන්ධයෙන් මීට පෙර කර ඇති සියළු උපදෙස් මින් අහෝසි වන අතර, ඉදිරියේ දී මේ අන්දමින් ක්‍රියා කළ යු කොමිෂන් සභාවේ නියමය පරිදි දැනුම් දෙමි.

04. 308:16 වැටුප් පරිමාණ වෙළඳ සහායක තනතුර සඳහා ද නව සුදුසුකම් පහතින් ද

| | |
|---|---|
| තනතුරේ නම:- | වෙළඳ සහායක |
| වැටුප් පරිමාණ අංකය:- | 308:16 |
| වැටුප් ක්‍රමය:- | 42000-900X10-960X8-58680 |
| අවම වයස:- | අවුරුදු 18 |
| උපරිම වයස:- | අවුරුදු 45 |
| තනතුර සඳහා සුදුසුකම්:- | (අ) සමුපකාර සේවක කණිෂ්ඨ පෙළ සහතික හෝ<br>(ආ) 08 වන ශ්‍රේණියේ සාමාර්ථය(වෙළඳ කටයුතු පිළිබඳ පළපුරුද්ද විශේෂ සුදුසුකමක් ලෙස සලකනු ලැබේ.) |

කේ.කේ. සිරිසේන,
ලේකම්,
සමුපකාර සේවක කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

පිටපත්:- 1. බස්නාහිර පළාත්, පළාත් මාර්ග හා සමුපකාර අමාත්‍යතුමාගේ පෞද්ගලික ලේකම්
2. ප්‍රධාන ලේකම් (බ.ප.)
3. ලේකම්, පළාත් මාර්ග හා සමුපකාර අමාත්‍යාංශය(බ.ප.)
4. සමුපකාර සංවර්ධන කොමසාරිස් හා සමුපකාර සමිති රෙජිස්ට්‍රාර්(බ.ප.)
5. සමුපකාර සංවර්ධන සහකාර කොමසාරිස් (කොළඹ, ගම්පහ, කළුතර)
6. ලේකම්, සමුපකාර සේවක කොමිෂන් සභාව
7. සියළුම පළාත් සමුපකාර සේවක කොමිෂන් සභා ලේකම්වරුන්
8. [illegible]